# අසමගි සමගි

මේ රටේ දේශපාලන පක්ෂ අතර එකඟතාවක් හා විරසකභාවයන් පිළිබඳ පරස්පර විරෝධී ප්‍රකාශයන් දිගටම කියවන්නට ලැබුණි.

රජය සහ විපක්ෂය අතර නව ව්‍යවස්ථාවක් පිළිබඳ කෙරෙන සාකච්ඡා සුවදායක බවක් පෙන්නුම් කරයි. එහෙත් මේ සාකච්ඡාවලට දෙමළ දේශපාලන පක්ෂවල ප්‍රතිචාරය කුමක් වේදැයි කිවනොහැකිය.

මේ අතර නිල නොවන ආරංචි මාර්ගවලින් දැනගන්නට ලැබෙන්නේ යෝජිත අධ්‍යාපන සංශෝධන පනතක් පිළිබඳ දෙමළ පක්ෂ ඇතුළු සෑම අංශයකම පුළුල් එකඟතාවක පෙර නිමිති දැකින්නට ලැබෙන බවයි.

*අවුරුදු 30කටත් අධික කාලයක් තිස්සේ පැවති බලගතු ත්‍රස්තවාදයක් පරාජය කොට ජයග්‍රහණය කළ රටක් "අපේ ආර්ථිකය ඉතා ශක්තිමත් යැයි" උදම් ඇනිම ආශ්චර්යයකි. දෙවන ලෝක සංග්‍රාමය අවසන් වු පසු ජයග්‍රාහී කණ්ඩායම් වු බ්‍රිතාන්‍ය, සෝවියට් දේශය හා ප්‍රංශය ද ආර්ථික වශයෙන් ශක්තිමත් වීමට ගත වු කාලය යුද්ධයෙන් පරාජය වු ජර්මනිය, ඉතාලිය හා ජපානය පිබිදීමට ගත් කාලයට වඩා අඩුවන්නේ යාන්තමිනි.*

මේ දක්වා මේ රටේ අධ්‍යාපනය දේශපාලන ප්‍රවාහයේ "තට්ටු මාරුව" මෙන්ම වංගගිරියක් පැටලෙමින් අයාලේ ගිය බව නොරහසකි. 1946 දී සම්මත වු නිදහස් අධ්‍යාපන ක්‍රමයට කණකොකා හැඬලුවේ 1947 පටන් බව රහසක් නොවේ.

දැනට ඉදිරිපත් කිරීම සඳහා සකස් කර තිබෙන පනත් කෙටුම්පතට දේශපාලන පක්ෂ සියල්ලේම ප්‍රතිපත්තිමය සහාය පළවන බව ඇසිමත් සතුටට හේතුවකි. රටේ මුළු අනාගතයම රැඳී ඇත්තේ නිදහස් සාධාරණ අධ්‍යාපන ක්‍රමයක් මත බව නොපිළිගන්නා කෙනෙක් සිටිත් නම් ඒ ජාතියේ අනාගතය ගැන සැලකිල්ලක් නැත්තෙකු බව නිසැකය.



ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්
ප්‍රවීණ මාධ්‍යවේදී
ඇස්.පියසේන

ව්‍යවස්ථාදයක සහ අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි එලදයී සාකච්ඡා පැවැත්වෙන අතර ප්‍රධාන දේශපාලන පක්ෂ අතර ප්‍රතිවාදී හැඟීම් උත්සන්න වන බවක්ද පෙනෙන්නට තිබේ.

අවුරුදු 30කටත් අධික කාලයක් තිස්සේ පැවති බලගතු ත්‍රස්තවාදයක් පරාජය කොට ජයග්‍රහණය කළ රටක් "අපේ ආර්ථිකය ඉතා ශක්තිමත් යැයි" උදම් ඇනිම ආශ්චර්යයකි. දෙවන ලෝක සංග්‍රාමය අවසන් වු පසු ජයග්‍රාහී කණ්ඩායම් වු බ්‍රිතාන්‍ය, සෝවියට් දේශය හා ප්‍රංශය ද ආර්ථික වශයෙන් ශක්තිමත් වීමට ගත වු කාලය යුද්ධයෙන් පරාජය වු ජර්මනිය, ඉතාලිය හා ජපානය පිබිදීමට ගත් කාලයට වඩා අඩුවන්නේ යාන්තමිනි.

ඒ අතින් බලන විට ආර්ථිකය ඉතා ශක්තිමත් යයි ජනතාවට හඬගා කීම මිරිගුවක් පෙන්වීම වැනි -විජ්ජාවක්" බව කිය යුතු නොවේ. රජයේ සේ-වකයින්ට -රුපියල් 10,000" ක වැටුප් වර්ධකයක් දෙන්නට එක් පක්ෂයක් පොරොන්දු වනවිට අපේ පක්ෂය අපට 10,000 ක් දෙන්නට බැරි 2500 ක් දෙන්නට පුළුවන් යැයි යන කියමන් දෙකම යථාර්ථවාදී හෝ ප්‍රායෝගිකද ? ඉටු කරන්නට බැරි අසීරු ප්‍රතිඥවන්හීදි පොරොන්දුවේ



විශාලත්වය හෝ ප්‍රමාණය වැදගත් වන්නේ මූලික වශයෙන් පොරොන්දු ඉෂ්ඨ කිරිම දුෂ්කර වන නිසාය.

පසුගිය 60 වසර තුල මේ රට පාලනය කල පක්ෂ දෙකම නිතරම බලයේ සිටින පක්ෂයට ප්‍රහාරයක් එල්ල කරන්නේ තමන්ගේ කාලයේ වු සිද්ධින් අමතක කරමිනි.

සමගියක් ගොඩනගා ගතයුතු අවස්ථාවේදී සබරගමුව පළාතේ විපක්ෂ මන්ත්‍රීවරයෙකු රජයට එල්ල කල ප්‍රහාරයක් ගැන මා සඳහන් කරන්නේ එම ප්‍රකාශය ඉතා අවසනාවන්ත සිද්ධින් පසුබිම් කරගත්තක් උඩ සිදුවු නිසාය.

මට ලංකාදීප පත්‍රයේ අනුවේදීය වාර්තාවක් කියවන්ට ලැබුනි. ලෙබනනයේ අනාථ වී සිටි ගෘහ සේවාකන් 175 දෙනෙකු ශ්‍රී ලංකාවට ගෙන්වාගත් බවත් තවත් එසේ අනාථ වී ඇති ලාංකිකයන් 3000 ක් පමණ ලෙබනනයේ සිටින බවත් එම වාර්තාවෙන් කියවුණි.

මෙහිදී මැද පෙරදිග කාන්තා රැකියා පිළිබඳ ඉතිහාසය දෙස හැරී බැලිම වටී.

1979 වර්ෂයේදී එවකට සිටි විදේශ ඇමතිවරයා එක්සත් ජාතික පක්ෂ කෘත්‍යාධිකාරි මණ්ඩලයේදි "අපූරු" අදහසක් ප්‍රකාශයට පත් කලේය.

ඔහු කියා සිටියේ "මැද පෙරදිග රටවලට ගෘහ සේවිකාවන් අවශ්‍ය වී ඇති බවත් , ඉන්දියාව මෙන්ම පකිස්ථානයද තම කාන්තාවන් ගෘහ සේවිකාවන් වශයෙන් යැවීම ප්‍රතික්ෂේප කරන නිසා දැනට එසේ යවන්නේ පිලිපීනය පමණක්" බවය.

ඔහු වැඩි දුරටත් කියා සිටියේ මේ අවස්ථාවෙන් අපට ප්‍රයෝජන ගැනිමට බො-හෝ ඉඩකඩ තිබෙන බවය.

"මුල්ගල" තැබුණේ එදය. එද පටන් කාන්තාවන් මැද පෙරදිග සංක්‍රමණය වුයේ සිය ගණනින් නොව දහස් ගණනිනි. වසර කීපයක් තුළ කොළඹ අවට ප්‍රදේශවලින් පමණක් නොව බදුල්ල, අනුරාධපුරය හා මඩකලපුව වැනි ප්‍රදේශ වලින්ද කාන්තාවෝ ගෘහ සේවය සඳහා පිටත්ව ගියේ නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේය.

එසේ ගිය ගෘහ සේවිකා-වන්ද සිය ගණනින් අතරමං වී ශ්‍රී ලංකාවට පැමිණි බව වාර්තා විය. 1984 දී ලෙබනනය බලා යන ගෘහ සේවිකාවන් 30 දෙනෙකු මදුරාසි ගුවන් තොටුපලේදී බෝම්බයකට හසුවී මියගිය අවස්ථාවේදී රජයට ලැබුණු නිල වාර්තා ඉතාම සංවේගදායකය.

බොම්බායේ සහ මදුරාසියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාල 1983-84 දෙවසරේදී දී පමණක් මැද පෙරදිග ගෙන යද්දී ඉන්දියාවේ අතරමං වු කාන්තාවන් 400 කට වඩා රජයේ වියදමින් ආපසු එවනු ලැබු බව වාර්තා විය.

මේ ගෘහ සේවිකා "ජාවාරම" කොරතරම් පුළුල් වීද යත් මැද පෙරදිග මධ්‍යම පන්තියේ පවුල් ද ශ්‍රී ලාංකීක ගෘහසේවිකාවක් සේවයේ තබා ගැනිම "සමාජ තත්ත්වයේ සංකේතයක් " වශයෙන් සැලකූහ.

1995 දී ආණ්ඩු බලය වෙනස් වී ගියත් නව රජයකට ද මේ තත්තවය වෙනස් කිරිම දුෂ්කර වුයේ ඒ වනවිටත් සංග්‍රමික ගෘහ සේවිකාවන්ගේ සංඛ්‍යාව දහස් ගණන් ඉක්මවා ඉලක්කම් හයට ළඟා වී තිබු හෙයිනි.

මේ පැරණී සිද්ධීන් පෙන්වා දීමට සිදු වුයේ අද ගෘහ සේවිකාවන්ගේ ඉරණමට පමණක් නොව ඒ නිසා විනාශ වු පවුල් ජීවිතවලට ද බලයේ සිටි සියලුම පක්ෂ වරදකරුවන් වන බව පෙන්වා දිම සඳහාය. එමනිසා මෙබඳු ප්‍රශ්න මතු කරගනිමින් ඉතා වැදගත් වු ව්‍යවස්ථා සංශෝධන හා අධ්‍යාපන ප්‍රතිපත්තීන් පිළිබඳව ඇතිකරගත හැකි එකඟතාවන්ට වැටකඩොලු නොබැඳිය යුතු බව පෙන්වා දීමට ය. පසුගිය අවුරුදු 30 ඇතුළත මෙන්ම තවමත් බලය පවත්වන "දුර්භාග්‍ය සමය" දුරු කිරිමට ප්‍රධාන දේශාපලන පක්ෂ එකඟව ක්‍රියා නොකරන්නේ නම් රටේ අනාගතය තවත් අඳුරුවනු නිසැකය.

අප මුහුණ පා සිටින විනාශයත් අසමගියත් දෙස මධ්‍යස්ථව බලන කෙනෙකුට පැතිර යන අන්ධකාරය පැහැදිලිව පෙනෙනු ඇත.

වේ ඉරණම ගැන සිතුවට මගේ සිහියට නැගෙන්නේ මීට දශක තුනකට පෙර පුවත්පතක මා දුටු විනෝදකාමී කාටුනයක්ය. Mutt And Jeff යන විකට කාටුනයේ Jeff චිත්‍රපටි තිරරචකයෙකු මෙන් නිෂ්පදකයකු ද පිටපතක් ඉදිරිපත් කර තිබුණි. නිෂ්පාදකයා සහ අතර දෙබස මෙසේ විය.

**නිෂ්පාදක :** කථාව නම් අපූරුයි. හැබැයි එච්චිර වියදම් කරන්න මා ළඟ සල්ලි නැහැ
**ජෙෆ්** : ඇයි?

**නිෂ්පාදක :** අන්තිම සටනට නිල්පාටින් 5000 යි. රතුපාටින් 5000 යි. පැයක දර්ශනයක් වුණාත් 10,000 කට ගෙවන්න සල්ලි කොහේද ?

**ජෙෆ්** : අයියෝ ඕක සිම්පල්නේ අපි අන්තිම සටනෙදී හොඳ මාරක ජීව උණ්ඩ "Live bullets" පාවිච්චි කරමු.





